# මැනිං එළවළු වෙළෙඳපොළ ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය

එල්.පී. රූපසේන

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ විශාලතම එළවළු/පලතුරු තොග වෙළෙඳපොළ වන මැනිං වෙළෙඳපොළේ සංවිධානය සහ ක්‍රියාකාරීත්වය සොයා බැලීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වේ. 2010 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ කරන ලද සමීක්ෂණයක තොරතුරු ඒ සඳහා මූලික වශයෙන් පාදක කරගන්නා ලදී. මෙම වෙළෙඳපොළ තුළ අලෙවි කුටි 1200 කට ආසන්න සංඛ්‍යාවක් පවතී. නමුත් එළවළු/පලතුරු තොග වෙළෙඳාම පමණක් කරන වෙළෙඳුන් සංඛ්‍යාව 400 ක් පමණ වේ. සාමාන්‍යයෙන් දිනකට එළවළු මෙ.ටො. 435 ක් සහ පලතුරු මෙ.ටො. 95ක් පමණ තොග වෙළෙඳාම සඳහා සපයනු ලැබේ. මෙහි දී දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් එළවළු/පලතුරු සැපයුව ද ප්‍රධාන සැපයුම් සිදු වන්නේ උඩරටින් හා පුත්තලමෙනි. තොග භාණ්ඩ රැගෙන එන වාහනවලින් 50% ක් පමණ පෙරවරු 4 වන විට වෙළෙඳපොළට පැමිණේ. එළවළු/පලතුරු රැගෙන එන වාහන වැඩි ප්‍රමාණයක් ආපසු යන විට අල,ලූණු, මිරිස්, පරිප්පු වැනි ද්‍රව්‍ය රැගෙන යන බව අනාවරණය විය. මැනිං වෙළෙඳපොළේ එළවළු/පලතුරු බෑම, පැටවීම සංවිධානාත්මක ව සිදු වේ. මෙහි නාටාමිවරු 1500 කට අධික සංඛ්‍යාවක් සිටින අතර, ඔවුන් ප්‍රදේශ අනුව සංවිධානවලට එකරාශී වී ඇත. වෙළෙඳපොළ මිල, ඉල්ලුම සහ සැපයුම අනුව තීරණය වන බව නිරීක්ෂණය විය. මැනිං වෙළෙඳපොළට අනෙකුත් අලෙවි මාර්ගවලින් තරඟයක් ඇති වී තිබෙන බැවින් කොමිස් වෙළෙඳුන් උපරිම මිලට නිෂ්පාදන අලෙවි කිරීමට පෙළඹේ. සැපයුම්කරුවන් වෙනත් අලෙවි මාර්ගවලට ඇදී යාම ඊට හේතුව යි. වෙළෙඳපොළට අවශ්‍ය අවම පහසුකම් නොමැති බැවින් වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම අවශ්‍ය වන අතර, ඒ සම්බන්ධයෙන් මේ වන විට අවධානය යොමු වී ඇත. එසේ ස්ථාපනය කිරීමේ දී එළවළු/පලතුරු තොග වෙළෙඳාමට අමතර ව සහල්, අල, ළූණු වැනි අනෙකුත් නිෂ්පාදන තොග අලෙවි කිරීමේ වෙළෙඳසල් ද ඒ ආසන්නයේ ඇති කළ යුතු ය. එසේ ම, එළවළු/පලතුරු තොග වෙළෙඳපොළ විවෘත කඩ කාමරවලින් යුක්ත සරල ව්‍යුහයකින් ගොඩනැඟිය යුතු ය.

## 1. හැඳින්වීම

කොළඹ ගැස්පහ කච්චේරිය මාර්ගයේ කඩ බක්කි 300 කින් සමන්විත එළවළු සහ පලතුරු තොග වෙළෙඳපොළ නගර සංවර්ධනය සඳහා ඉන් ඉවත් කර, 1983 ජූලි මාසයේ දී දැනට පවතින තොග වෙළෙඳ මධ්‍යස්ථානයෙහි තාවකාලික ව ස්ථාපනය කරන ලදී (Rupasena, 1984). එය කලින් පැවැති තොග වෙළෙඳ මධ්‍යස්ථානයට වඩා වෙනස් ය. කලින් තිබූ වෙළෙඳපොළ කණුවලින් සමන්විත විවෘත ශාලාවකි. නමුත් මැනිං එළවළු වෙළෙඳපොළ බිත්තිවලින් ආවරණය වූ විශාල ගොඩනැඟිලි සමූහයකින් සමන්විත වූවකි. එය, පැරණි සීනි ගබඩාවක් වූ අතර, ඉදිකරනු ලැබුවේ 1900 දශකයේ මුල් භාගයේ ය. මැනිං ආණ්ඩුකාරවරයාගේ කාලයේ ඉදිකළ බැවින් 'මැනිං' නම යෙදී ඇත. දිවයිනේ විශාලතම එළවළු තොග වෙළෙඳපොළ මැනිං වෙළෙඳපොළ වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයක් ජීවත්වන බස්නාහිර පළාතේ අතිබහුතරයකට එළවළු සහ පලතුරු ලබාදෙන්නේ මෙම වෙළෙඳපොළ හරහා ය. වෙළෙඳ සංගමයට අනුව, මෙම වෙළෙඳ මධ්‍යස්ථානය ආශ්‍රිත ව සෘජු හා වක්‍ර ව 5000-6000 ක ප්‍රමාණයක් තම ජීවනෝපාය සලසා ගන්නා බවත්, ඒ අනුව ඔවුන්ගෙන් යැපෙන මුළු සංඛ්‍යාව ලක්ෂ 5 ක් පමණ බවත් සඳහන් වේ. එමෙන් ම මෙරට දහස් ගණන් ගොවි ප්‍රජාව රැක ගැනීම

සඳහා ඔවුන්ගේ නිෂ්පාදනවලට ඉහළ මිලක් ලබාදෙමින් සහ ණය පහසුකම් ලබාදෙමින් හාරදූර කාර්යයක් මෙම වෙළෙඳපොළ මගින් සිදු වේ. මැනිං එළවළු තොග වෙළෙඳපොළ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිදුකරන ලද අධ්‍යයනයක ප්‍රතිඵල ඉදිරිපත් කිරීම මෙම ලිපියේ පරමාර්ථය වේ.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ක්‍රම 4 කින් තොරතුරු රැස්කරන ලදී.

01. කොළඹ නගර සභාවේ දායකත්වයෙන් භූමියේ විශාලත්වය, වෙළෙඳුන් සංඛ්‍යාව සහ වෙළෙඳසැල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලදී.

02. සමීක්ෂණයක් මගින් එළවළු සහ පලතුරු රැගෙන එන සහ රැගෙන යන වාහන සංඛ්‍යාව, එළවළු ප්‍රමාණය, වාහන පැමිණෙන සහ පිටත් ව යන ප්‍රදේශ විමසීමකට භාජනය කරන ලදී.

03. සාකච්ඡා මගින් ඉහත තොරතුරු තවදුරටත් විමසා බැලීම සිදු කෙරිණි.

    මෙහි දී සාමූහික සාකච්ඡා සහ පෞද්ගලික සාකච්ඡා පවත්වන ලදී. මැනිං වෙළෙඳ සංගමය සමඟ සාමූහික ව සාකච්ඡාවක් පවත්වන ලද අතර, ඒ සඳහා සංගමයේ සභාපති, ලේකම් ඇතුළු 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී වූහ. ඊට අමතර ව පෞද්ගලික සාකච්ඡා රැසක් සෑම කොටසක් ම ආවරණය වන පරිදි පවත්වන ලදී. තොග වෙළෙඳුන්, රියැදුරන්, සිල්ලර වෙළෙඳුන්, පොලිස් නිලධාරීන්, නගරසභා නිලධාරීන් සහ නාටාම්වරු යන පාර්ශ්ව පෞද්ගලික සාකච්ඡාවට භාජනය වූහ.

04. නිරීක්ෂණ මගින් මැනිං වෙළෙඳපොළේ විශාලත්වය, වෙළෙඳුන් සංඛ්‍යාව, පැමිණෙන හා පිටත් වන ලොරි සංඛ්‍යාව සහ වෙළෙඳපොළ කටයුතු සිදුවන ආකාරය පරීක්ෂාවට ලක්විය.

## 3. වෙළෙඳපොළ ව්‍යුහය

නගර සභාවේ තොරතුරු අනුව, මැනිං භූමි භාගය අක්කර 2 1/2 කි. නමුත් වෙළෙඳ සංගමයේ තොරතුරු පරිදි, එය අක්කර 4 ක පමණ භූමි භාගයක විසිරී පවතී. නගර සභාවේ තොරතුරු අනුව, සම්පූර්ණ කඩ සංඛ්‍යාව 1098 කි. ඉන් වැඩි ප්‍රමාණයක් අඩි 6x8 අතර ප්‍රමාණයක විශාලත්වයෙන් යුක්ත ය. වෙළෙඳ සංගමය විසින් ද එය සනාථ කරන ලදී. භාණ්ඩ වර්ග අනුව කඩ බෙදී ගොස් ඇති ආකාරය වගු අංක 1 දැක්වේ.

වගු අංක 1

**මැනිං වෙළෙඳපලේ භාණ්ඩ අනුව කඩකාමර ව්‍යාප්තිය**

| වර්ගය | කඩකාමර සංඛ්‍යාව |
|---|---|
| එළවළු | 789 |
| වියළි ආහාර වර්ග | 86 |
| පලතුරු | 62 |
| කෙසෙල් පමණක් | 73 |
| කරවල | 24 |
| පොල් | 04 |
| බිත්තර | 05 |
| මස්කඩ : හරක්මස් - 08, ඌරුමස් - 01, එළුමස් - 02 | 11 |
| කුකුල් මස් හා ජීව සතුන් | 14 |
| වෙනත් (විවිධ ආහාර) | 15 |
| භෝජනාගාර (හෝටල්) | 10 |
| සිසිල් බීම අලෙවිසැල් (ස්නැක්බාර්) | 03 |
| සැලුන් (බාබර් සාප්පු) | 02 |
| **මුළු අලෙවිසැල් සංඛ්‍යාව** | **1098** |

මූලාශ්‍රය : කොළඹ මහ නගර සභාව.

මෙම අලෙවිසැල් වෙළෙඳපොළ තුළ තාවකාලික ව අලෙවි කටයුතුවල නිරත වුවත් දෛනික ව රුපියල් 50 ක මුදලක් නගර සභාව වෙත ගෙවනු ලබන අතර, එළවළු කඩ සඳහා රු. 850, 1000 සහ 1200 වැනි විවිධ බදු ප්‍රමාණයක් ගෙවනුයේ ඒ ඒ වෙළෙඳපලේ ඉඩ ප්‍රමාණය හා පිහිටීම අනුව ය. මෙයට අමතර ව, තවත් සිල්ලර එළවළු කඩ කිහිපයක් රු. 500 ත් 525 ත් අතර බදු මුදලක් ගෙවන අතර, කරවල කඩ රු. 2500 ත් 3500 අතර මුදලක් ද, භෝජනාගාර (හෝටල්) වලින් රු. 4000 ක මාසික බදු මුදල් ද ගෙවන බව නගර සභා වාර්තා දක්වා ඇත. මෙයට අමතර ව අනෙකුත් විවිධ වෙළෙඳසැල් හෝ ව්‍යාපාරික ස්ථාන මාසික ව රු. 1500 ක බදු මුදල් ප්‍රමාණයක් ගෙවනු ඇත. වර්ෂ 2010 අගෝස්තු මාසය සඳහා නගර සභාව මැනිං වෙළෙඳපොළින් ලැබූ මුළු ආදායම රු. 8,84,590 ක් වී ඇත.

සමීක්ෂණයේ දී වෙළෙඳසැල් ගණනය කිරීමට ද උත්සාහ ගන්නා ලදී. එහි ප්‍රතිඵල වගු අංක 2 හි දැක්වේ. ඒ අනුව, පලතුරු වෙළෙඳසැල් පිහිටා ඇත්තේ ගොඩනැඟිලි දෙකක පමණි. එක් ගොඩනැඟිල්ලක (අලෙවිසැල් 108) සිල්ලර වෙළෙඳාම පමණක් සිදු වේ. එළවළු තොග වෙළෙඳාම පමණක් සිදුවන ගොඩනැගිල්ලක් ඇත. එහි කඩ කාමර 109 කි. එළවළු තොග වෙළෙඳුන් සංඛ්‍යාව 400 ක් පමණ වේ. තොග වෙළෙඳාමින් පාඩු සිදු වී සිල්ලර වෙළෙඳාමට පිවිසි පිරිසක් ද සිටින බව සාකච්ඡාවේ දී හෙළි විය. සිල්ලර වෙළෙඳාමේ වර්ධනයක් මෑත කාලයේ දී සිදුවෙමින් පවතී. සිල්ලර අලෙවිසැල් 98 ක් වෙළෙඳපොළ වටා පිහිටුවා ඇත. මීට අමතර ව විවෘත ස්ථානවල එළවළු, පලතුරු අලෙවි කරන වෙළෙඳුන් 50 ක් පමණ ඇත.

වගු අංක 2

**වෙළෙඳසැල් හා වෙළෙඳුන් ගණන**

| ගොඩනැගිලි * | අලෙවිසැල් ගණන | විවෘත කඩ | වෙළෙඳුන් ගණන | වර්ගය |
|---|---|---|---|---|
| A | 305 | - | 269 | එළවළු, පලතුරු |
| B | 109 | - | 125 | එළවළු |
| C | 165 | - | 175 | එළවළු සහ මස් |
| D | 100 | 13 | 135 | පලතුරු, පොල් සහ කිරි |
| E | 198 | 60 | 240 | එළවළු |
| F | 108 | 27 | 150 | සිල්ලර (එළවළු, පොල්) |
| G | 98 | - | 98 | සිල්ලර (කරවල අතිරේක ආහාර) |
| එකතුව | 1083 | 100 | 1192 | - |

* ඇමුණුම අංක 1 යටතේ ඇති මැනිං වෙළෙඳපොළ දළ සැලැස්මට අනුව
මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

## 4. වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය

එළවළු සැපයීම, පිටවීම සහ මිල තීරණය වන ආකාරය මෙහි දී සාකච්ඡා කෙරේ. මැනිං වෙළෙඳපොළට භාණ්ඩ රැගෙන ඇතුල්වන වාහන සංඛ්‍යාව දෙදිනක් තුළ ගණනය කරන ලදී. ඒ අනුව, එකී දෙදින තුළ වාහන 237 ක් මැනිං වෙළෙඳපොළට භාණ්ඩ රැගෙන ඇතුල් වී ඇත (වගු අංක 3). ඒ අනුව, එක් දිනකට සාමාන්‍යයෙන් වාහන 120 ක් පමණ භාණ්ඩ රැගෙන වෙළෙඳපොළට ඇතුල් වේ. 1991 වර්ෂයේ ජූලි මාසයේ කරන ලද අධ්‍යයනයකට අනුව සිකුරාදා දිනෙක පැමිණුන වාහන සංඛ්‍යාව 80 ක් වන අතර, සෙනසුරාදා දින එම සංඛ්‍යාව 62 ක් ලෙස වාර්තා කර ඇත (Nanayakkara, 1991). සාමාන්‍යයෙන් ජූලි මාසයේ එළවළු හිඟ නිසා වෙළෙඳපොළට පැමිණෙන ලොරි ප්‍රමාණය අඩු වේ. එළවළු බහුල කාලයේ වාහන 150 ක් පමණ පැමිණෙනු ඇතැයි අනුමාන කළ හැක. පැමිණෙන වාහනවලින් වැඩි ප්‍රමාණයක් විශාල ප්‍රමාණයේ ලොරි බව ද අනාවරණය විය. සමීක්ෂණය සිදුකළ සිකුරාදා දින විශාල ලොරි 75 ක් ද සෙනසුරාදා දින විශාල ලොරි 81 ක් ද පැමිණ තිබුණි.

වගු අංක 3

**කෘෂි නිෂ්පාදන රැගෙන එන වාහන සංඛ්‍යාව**

| වාහන වර්ගය | 2010.10.29 සිකුරාදා | 2010.10.30 සෙනසුරාදා | එකතුව |
|---|---|---|---|
| විශාල ලොරි | 75 | 81 | 156 |
| මධ්‍යම ලොරි | 19 | 39 | 58 |
| කුඩා ලොරි | 08 | 10 | 18 |
| ත්‍රීවීලර් | 04 | - | 04 |
| වෑන් | 01 | - | 01 |
| එකතුව | 107 | 130 | 237 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

මෙම වාහනවල වැඩිපුර ගෙනඑනු ලබන්නේ එළවළු සහ පලතුරු ය (වගු අංක 4). දින දෙක තුළ එළවළු රැගෙන පැමිණි ලොරි සංඛ්‍යාව 157 කි. එනම්, මුළු වාහන ප්‍රමාණයෙන් 66% කි. පලතුරු රැගෙන ආ වාහන සංඛ්‍යාව 47 කි. එනම් 20% කි. 1996 කරන ලද සමීක්ෂණයකට අනුව දිනකට පැමිණි එළවළු සහ පලතුරු ලොරි සංඛ්‍යාව 84 කි. ඊට අමතර ව දිනකට පොල් ලොරි 5ක් පමණ පැමිණේ (Merle Menegay, *et al* 1996).

**වගු අංක 4**

**රැගෙන එන ද්‍රව්‍ය අනුව වාහන වර්ග කිරීම (දින දෙක තුළ)**

| ද්‍රව්‍ය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එළවළු | 157 | 66 |
| පලතුරු | 47 | 20 |
| අතිරේක ආහාර බෝග | 2 | 1 |
| කුකුල්මස් / කුකුළත් | 9 | 4 |
| මස් | 2 | 1 |
| වෙනත් (පොල්, තැඹිලි, කුළුබඩු, කිරිපිටි, පුවක්, වැනි ද්‍රව්‍ය) | 20 | 8 |
| එකතුව | 237 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

වාහන පැමිණෙන ප්‍රදේශ අනුව වර්ග කිරීමට ද උත්සාහ කරන ලදී. එහි ප්‍රතිඵල වගු අංක 5 හි පෙන්නුම් කර ඇත. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් මැනිං වෙළෙඳපොළට ද්‍රව්‍යයන් රැගෙන එන බව අනාවරණය විය. වැඩිපුර ම වාහන නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙල, බලංගොඩ, මහනුවර, ඇඹිලිපිටිය, පුත්තලම සහ ගම්පහ ප්‍රදේශවලින් පැමිණ තිබුණි. එම ප්‍රදේශවලින් පැමිණෙන වාහන ප්‍රමාණය මැනිං වෙළෙඳපොළට ද්‍රව්‍යයන් රැගෙන එන මුළු වාහන ප්‍රමාණයෙන් 65% ක් පමණ වේ.

වගු අංක 5

### ප්‍රදේශ අනුව ද්‍රව්‍ය රැගෙන එන වාහන සංඛ්‍යාව (දින දෙක තුළ)

| ප්‍රදේශය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| නුවරඑළිය, තලවකැලේ, කඳපොළ, රාගල, පුස්සැල්ලාව, බෝපත්තලාව | 31 | 13 |
| වැලිමඩ, බණ්ඩාරවෙල, කැප්පෙටිපොළ | 16 | 7 |
| බලංගොඩ හා අවට ප්‍රදේශ | 18 | 8 |
| නුවර, හඟුරන්කෙත, තලවතුඔය, මාරස්සන, රිකිල්ලගස්කඩ | 14 | 6 |
| ඇඹිලිපිටිය, සූරියවැව, ගොඩකවෙල, පල්ලේබැද්ද | 29 | 12 |
| දඹුල්ල | 5 | 2 |
| බෙලිඅත්ත, තිස්ස, කතරගම, වීරකැටිය, අම්බලන්තොට, හම්බන්තොට | 19 | 8 |
| පුත්තලම, හලාවත, මාරවිල, නොරොච්චෝලේ | 28 | 12 |
| මැල්සිරිපුර, කොබෙයිගනේ, හෙට්ටිපොළ, කුලියාපිටිය, තිකවැරටිය | 9 | 4 |
| මොනරාගල, වැල්ලවාය, බුත්තල, සියඹලාණ්ඩුව | 11 | 5 |
| අනුරාධපුර, රාජාංගනය, තලාව, තඹුත්තේගම | 15 | 6 |
| නැගෙනහිර ප්‍රදේශ (අම්පාර, කල්මුනේ, අක්කරපත්තු, පදියතලාව, මඩකලපුව) | 3 | 1 |
| උතුරු ප්‍රදේශ (යාපනය, වව්නියාව) | 4 | 2 |
| ගම්පහ (මිනුවන්ගොඩ, කොටදෙණියාව, දිවුල්පිටිය) ජා-ඇල, ගිරිඋල්ල, | 20 | 8 |
| කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ අවට ආසන්න ප්‍රදේශවලින් මැනිං වෙළෙඳපොළේ ඇති සිල්ලර වෙළෙඳසැල් වෙත කුළුබඩු, බිස්කට්, කිරිපිටි ආදිය සපයන වාහන) | 8 | 3 |
| වෙනත් -(සුළු සැපයුම් ප්‍රදේශ) | 7 | 3 |
| එකතුව | 237 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

මැනිං වෙළෙඳපොළට රැගෙන එන ද්‍රව්‍යයන් හි ප්‍රමාණය පිළිබඳ විස්තර වගු අංක 6 න් දැක්වේ. එම ප්‍රමාණයන් දින දෙකක් සඳහා ය. ඒ අනුව දිනකට පැමිණෙන ප්‍රමාණය මෙ.ටො. 565 ක් පමණ වේ. මෙකී ප්‍රමාණයෙන් මෙ.ටො. 435 ක් එළවළු වන අතර, මෙ.ටො. 95 ක් පලතුරු වේ. 1991 වර්ෂයේ ජූලි මාසයේ කරන ලද සමීක්ෂණයකට අනුව දිනකට පැමිණෙන එළවළු ප්‍රමාණය මෙ.ටො. 349 ක් වන අතර, පලතුරු ප්‍රමාණය මෙ.ටො. 25 සිට 35 අතර වේ (Nanayakkara, 1991).

වගු අංක 6

**වෙළෙඳපොළට රැගෙන එන ද්‍රව්‍යයන් ප්‍රමාණය (දින දෙක තුළ)**

| ද්‍රව්‍යයන් | ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|
| එළවළු | 868,845 |
| පලතුරු | 188,800 |
| අතිරේක ආහාර ද්‍රව්‍ය | 10,400 |
| කුකුල් මස් | 6,450 |
| මස් | 400 |
| වෙනත් (පොල්,තැඹිලි, කුළුබඩු, කිරිපිටි, පුවක්, වැනි ද්‍රව්‍ය) | 51,200 |
| එකතුව | 1,126,095 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

එළවළු/පලතුරු රැගෙන එන වාහන ආපසු යන විට ගෙනයන ද්‍රව්‍යයන් පිළිබඳ විමසීමක් ද කරන ලදී. ඒ පිළිබඳ විස්තර වගු අංක 7 න් දැක්වේ. ඒ අනුව මුළු වාහන ප්‍රමාණය 48% ක් ම අල, ලූනු, මිරිස් වැනි අතිරේක ආහාර බෝග රැගෙන යයි. වාහන ප්‍රමාණයෙන් 22%ක් කුමන හෝ ද්‍රව්‍යයක් ගෙනයාමට බලා සිටී. ඔවුන්ගෙන් ද කොටසක් අල, ලූනු, මිරිස් වැනි අතිරේක ආහාර බෝග රැගෙන යන බව හෙළිදරව් විය.

වගු අංක 7

**වාහන ආපසු යනවිට දී ගෙනයන ද්‍රව්‍යයන්**

| ද්‍රව්‍ය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එළවළු | 4 | 2 |
| අතිරේක ආහාර | 114 | 48 |
| ගොඩනැඟිලි ද්‍රව්‍ය | 38 | 16 |
| පොහොර | 24 | 10 |
| වෙනත් වාහන (ද්‍රව්‍ය පැටවීමට අපේක්ෂාවෙන් සිටින) | 52 | 22 |
| වෙනත් (සත්ව ආහාර, ඇසුරුම් පෙට්ටි. කෘෂි රසායන ද්‍රව්‍ය) | 5 | 2 |
| එකතුව | 237 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

ආපසු රැගෙන යන ද්‍රව්‍යයන් ලබා ගන්නා ස්ථානය පිළිබඳ විස්තර වගු අංක 8 න් පෙන්නුම් කර ඇත. ඒ අනුව වාහන සංඛ්‍යාවෙන් 48% ක් හතරවන හරස් වීදියට අතිරේක ආහාර ද්‍රව්‍ය පැටවීම සඳහා පිටත්ව යන බව අනාවරණය විය. එමෙන් ම වාහනවලින් 16% ක් පෑලියගොඩ, හුණුපිටිය, ජා-ඇල ප්‍රදේශවලින් ද්‍රව්‍ය පටවාගෙන යන බව ප්‍රකාශ කරන ලදී.

**වගු අංක 8**

**වාහන ආපසු යාමේ දී ද්‍රව්‍ය රැස්කරගත්තා ස්ථාන**

| රැස් කරගත් ස්ථානය (දින දෙක තුළ) | වාහන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| මැනිං වෙළෙඳපොළ | 4 | 2 |
| හතරවන හරස් වීදිය | 114 | 48 |
| කේසර් වීදිය | 10 | 4 |
| ආමර් වීදිය | 7 | 3 |
| කොළඹ නගරය තුළ වෙනත් ස්ථාන | 7 | 3 |
| පෑලියගොඩ, නුගේගොඩ, ජා-ඇළ | 38 | 16 |
| වෙනත් (කොළඹින් පිට ප්‍රදේශ) | 5 | 2 |
| සඳහන් නො කළ | 52 | 22 |
| එකතුව | 237 | 100 |


මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

වෙළෙඳපොළක් සැපයුම්කරුවන්ගෙන් සහ ගැණුම්කරුවන්ගෙන් සමන්විත වේ (රූපසටහන් අංක 1). මැනිං තොග වෙළෙඳපොළේ සැපයුම්කරුවන් වන්නේ, කොමිස් වෙළෙඳුන් ය. ඔවුන් 400 කට ආසන්න සංඛ්‍යාවක් සිටී. කොමිස් වෙළෙඳුන් යනු, භාණ්ඩ අයිතිකරුවන් නොවේ. එනම්, ඔවුහු මිල දී ගැනීමක් නො කරති. සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ ලබාගෙන ඔවුන් වෙනුවෙන් අලෙවිකර කොමිස් මුදලක් ලබාගනී. මැනිං වෙළෙඳපොළේ එසේ සිටින එළවළු සහ පලතුරු අලෙවි කරන කොමිස් වෙළෙඳුන් 10% ක මුදලක් කොමිස් වශයෙන් ලබාගනී. ඔවුන්ට විකිණීම සඳහා එළවළු සපයන සැපයුම්කරුවන් කොටස් දෙකකි. එනම්, ගොවීන් සහ එකතු කරන්නන් ය. නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙල මාතලේ වැනි වසර පුරා එළවළු වගා කරන ගොවීන් මැනිං වෙළෙඳපොළ වෙළෙඳුන් සමඟ සෘජු සබඳතා පවතී. කොමිස් වෙළෙඳුන් වගා කිරීමට පමණක් නොව මගුල්/මරණ වැනි හදිසි අවස්ථා සඳහා ද ණය දෙනු ලැබේ. ගොවීන් පවා තමාගේ එළවළු එසේ නැතිනම් පලතුරු ප්‍රමාණයන් සටහන් කර “ඔබගේ ව්‍යාපාර කටයුතු සාර්ථක වේවා” ලෙස ආශිංසනය කරමින් ලියුම්කවර ලොරි හිමියන් අත එවනු ලබන අවස්ථා ද ඇත. ඒ මට්ටම දක්වා මෙම දෙපාර්ශ්වය අතර සම්බන්ධතාවය සාර්ථක වී ඇත. කොමිස් වෙළෙඳාම දෙපාර්ශ්වය මත පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවය මත සිදුවේ. සැපයුම්කරු මිල දැනගනු ලබන්නේ නිෂ්පාදන අලෙවිකර බිල ලැබුණු පසුව ය.

මැනිං වෙළෙඳපොළට එළවළු/පලතුරු සපයන දෙවන පාර්ශ්වය එකතු කරන්නන් ය. මේ ආකාරයට එළවළු/පලතුරු බහුලව අනුරාධපුරය, මීගින්නලය, හම්බන්තොට, පුත්තලම වැනි ප්‍රදේශවලින් එවනු ලැබේ. මෙම සැපයුම්කරුවන්ගෙන් සමහරුන්ට වාහන පහසුකම් ඇත. එකතුකරන්නන් කෙලින් ම ගොවීන්ගෙන් නිෂ්පාදන මිල දී ගනී. කොටසක් පොළවලින් මිල දී ගන්නා අතර, තවත් කොටසක් එකතු කරන මධ්‍යස්ථාන පිහිටුවා එහි දී මිල දී ගනී. ගොවීන් සහ එකතුකරන්නන්ට අමතර ව සමහර කොමිස් වෙළෙන්දෝ නිෂ්පාදන ප්‍රදේශවලට ගොස් එළවළු මිලදී ගෙන මැනිං වෙළෙඳපොළ තුළ අලෙවි කරති.

රූපසටහන් අංක 1

**මැනිං වෙළෙඳපොළ සැපයුම්කරුවන් සහ ගැණුම්කරුවන්**




මැනිං වෙළෙඳපොළට එළවළු එවීමේ දී දඹුල්ලේ මෙන් සැපයුම්කරුවන් පැමිණෙන්නේ නැත. ප්‍රවාහනකරුවන් හරහා තම නිෂ්පාදන වෙළෙඳපොළට එවනු ලැබේ. සැපයුම්කරුවෝ (ගොවීන් සහ එකතු කරන්නන්) තමන්ගේ නිෂ්පාදන වර්ගය, ප්‍රමාණය සහ ඒවා යැවිය යුතු මැනිං මාර්කට් වෙළෙඳපොළේ කඩ බක්කියේ නොම්මරය සහ වෙළෙඳ මහතාගේ මුලකුරු සමඟ ලේබලයක් සවස් වරුවේ ප්‍රවාහනකරුවන්ට බාර දෙති. ප්‍රවාහනකරුවන් එකී තොග මැනිං වෙළෙඳපොළට ගෙන එනු ලැබේ. ප්‍රමාද වුව හොත් නිෂ්පාදනවලට ලැබෙන මිල අඩුවන නිසාත් වාහන තදබදය වැඩිවන නිසාත් ප්‍රවාහනකරුවෝ හැකි තරම් කල් වේලා ඇතිව මැනිං වෙළෙඳපොළට පැමිණීමට උත්සහ කරති (වගු අංක 9). වාහනවලින් 50% ක් පෙරවරු 4.00 වන විට වෙළෙඳපොළට පැමිණ තිබුණි. කලින් පැමිණෙන ලොරි වෙළෙඳපොළ තුළට පැමිණ නතර කරන අතර, අනෙක් ලොරි පිටුපස නතර කර තිබේ. එළවළු/පළතුරු රැගෙන එන ලොරි පනහක් පමණ එකවර මැනිං වෙළෙඳපොළට ඇතුළත් කිරීමට හැකියාව ඇත. එම ලොරි පිට වූ පසු අනික් ලොරි ඇතුළට ගනු ලැබේ. මැනිං වෙළෙඳපොළෙන් පිටත නවතා ඇති ලොරි ඇතුළට ගැනීමට පෙර සිට ම එළවළු/ පළතුරු බෑම සිදු කරනු ලැබේ. මැනිං වෙළෙඳපොළේ වෙළෙඳ කටයුතු ආරම්භ වන්නේ පෙ.ව. 4.30 ට පමණ ය.

**වගු අංක 9**

**එළවළු/පළතුරු රැගෙන වාහන පැමිණෙන වේලාව**

| වේලාව | 2010.10.29 සිකුරාදා | 2010.10.30 සෙනසුරාදා | එකතුව |
|---|---|---|---|
| 1.00 පෙ.ව. - 2.00 පෙ.ව. | 10 | 15 | 25 |
| 2.00 පෙ.ව. - 3.00 පෙ.ව | 14 | 18 | 32 |
| 3.00 පෙ.ව. - 4.00 පෙ.ව. | 30 | 32 | 62 |
| 4.00 පෙ.ව. - 5.00 පෙ.ව. | 21 | 37 | 58 |
| 5.00 පෙ.ව. - 6.00 පෙ.ව. | 20 | 14 | 34 |
| පෙ.ව. 6.00න් පසු | 12 | 14 | 26 |
| එකතුව | 107 | 130 | 237 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

එළවළු/පලතුරු ලොරිවලින් බෑම සංවිධානාත්මක ව සිදුවන බව නිරීක්ෂණය විය. එළවළු/පලතුරු බෑම සහ පැටවීමට සම්බන්ධ නාටාම්වරු 1500 කට ආසන්න ප්‍රමාණයක් මැනිං වෙළෙඳපොළ තුළ සිටී. විවිධ පළාත්වලින් පැමිණෙන නිෂ්පාදන බෑම ප්‍රදේශ අනුව සංවිධානය වූ නාටාම් පිරිසක් විසින් කරනු ලැබේ. එලෙස සංවිධානය වූ නාටාම් කණ්ඩායම් 15 ක් පමණ ඇත. එම කණ්ඩායම් ප්‍රදේශයේ නාමයෙන් හඳුන්වනු ලැබේ. ඇඹිලිපිටිය ලයින්, ගොඩකවෙල ලයින්, නුවරඑළිය ලයින්, බණ්ඩාරවෙල ලයින්, වැලිමඩ ලයින්, මාතලේ ලයින් උදාහරණ කිහිපයකි. ඒ ඒ ලයින් බාර පුද්ගලයෙකු (ඕනර්) සිටී. එම පුද්ගලයා විසින් ලොරි රියැදුරන්ගෙන් භාණ්ඩ ලැයිස්තුව ගෙන, අදාළ නාටාම්වරුන් ලවා එකී භාණ්ඩ කඩවලට යවනු ලැබේ. එළවළු/පලතුරු තොගය ලැබුණු බව සහතික කිරීමට කඩ හිමියන් විසින් තම කඩයේ නොම්මරය සටහන් කර ඇති තහඩු කැබැල්ලක් (ටෝකන්) නාටාම්ට දෙනු ලැබේ. එම ටෝකන් සියල්ල එකතු වූ පසු ඕනර්ට දෙනු ලැබේ. ඕනර් ඒවා රැගෙන කඩවලට ගොස් ලොරි කුළිය සහ නාටාම් කුළිය එකතු කරගෙන පැමිණ නාටාම්වරුන්ට ඔවුන්ගේ ගාස්තු සහ ලොරි කුළියෙන් 5% ක් තබා ගෙන ඉතිරිය ලොරි රියැදුරන්ට ද බාර දේ. මෙම කටයුතු සිදුවන්නේ පෙ.ව. 9.00 න් පසුව ය. එනම් එළවළු/පලතුරු විකුණා අවසන් වූ විට ය. ලොරි කුළිය තුන් ආකාරයට අය කෙරේ. ඒ කිලෝ එකකට, කැල්ලකට සහ ලෝඩ් එකකට වශයෙනි. වැලිමඩ ප්‍රදේශයේ දුර අනුව කිලෝ එකකට රු.2.50-3.50 අතර ප්‍රමාණයක් ද. බණ්ඩාරවෙල ප්‍රදේශයෙන් කැල්ලකට රු.100 ක් ද අය කෙරේ. සූරියවැව සිට ලෝඩ් එකකට රු.22,000 ක් අය කෙරේ. එළවළු බෑම සඳහා නාටාම් කුළිය කැල්ලකට රු. 15 කි.

වෙළෙඳපොළේ සිටින අනිකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ ගැණුම්කරුවන් ය. ප්‍රධාන ම ගැණුම්කරුවන් වන්නේ පොළ වෙළෙඳුන් ය. ඔවුන් කිහිපදෙනෙකු එකතු වී ලොරියක් කුළියට ගෙන එළවළු මිලදී ගැනීමට පැමිණේ. මෙහි දී උෟරුගස් මංහන්දිය සහ වදුරඹ ප්‍රදේශවලින් පැමිණි ලොරි රියැදුරන් සහ වෙළෙඳුන් සමඟ සාකච්ඡා කරන ලදී. කොළඹ සිට උෟරුගස්මංහන්දියට කැල්ලකට රු. 60 ක් ද වදුරඹට කැල්ලකට රු.150 ක් ද ලොරි කුළිය ලෙස අය කෙරේ. පොළ සිල්ලර වෙළෙඳුන් උදෙන් ම වෙළෙඳපොළට පැමිණේ. දෙවන ප්‍රධාන ගැණුම්කරුවන් පිරිස වන්නේ, මාර්කට් සිල්ලර වෙළෙඳුන් ය. ඒ සඳහා වෙන්වූ වෙනම ලොරි තිබේ. උදාහරණයක් ලෙස මැනිං වෙළෙඳපොළේ සිට ගම්පහ මාර්කට් එකට දිනපතා ලොරි දෙකකින් එළවළු ප්‍රවාහනය කෙරේ. තුන්වන ගැණුම්කරු පාර්ශ්වය වන්නේ හෝටල්වලට එළවළු සපයන සැපයුම්කරුවන් ය. සතරවන පාර්ශ්වයට අනෙකුත් ගැණුම්කරුවන් (සිල්ලර කඩ හිමියන්, උත්සව සඳහා මිලදී ගන්නන්) ඇතුළත් වේ. ඔවුහු බොහෝ විට ත්‍රිවිලර් මඟින් එළවළු රැගෙන යති. මැනිං වෙළෙඳපොළ තුළ පමණක් ලියාපදිංචි කළ ත්‍රිරෝද රථ 200 ක් පමණ පවතී.

මැනිං වෙළෙඳපොළට එළවළු සහ පලතුරු මිල දී ගැනීමට ගැණුම්කරුවන් පැමිණෙන ප්‍රදේශ පිළිබඳ සොයා බැලීම සඳහා එම ද්‍රව්‍ය මිල දී ගැනීමට වාහන පැමිණෙන ප්‍රදේශ පිළිබඳ අධ්‍යයනය කරන ලදී. ඒ පිළිබඳ විස්තර වගු අංක 10 හි දක්වා ඇත. ඒ අනුව මැනිං වෙළෙඳපොළේ එළවළු සහ පලතුරු අලෙවිය කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක තුනට ප්‍රධාන වශයෙන් සීමා වී ඇත. මේ අතරින් කොළඹ නගරය ප්‍රධානත්වයක් ගනී. අතීතයේ දී කොළඹ තොග වෙළෙඳපොළෙන් ලංකාවේ ගාල්ල, මාතර වැනි ඈත ප්‍රදේශවලට එළවළු සහ පලතුරු ප්‍රවාහනය කළත් දැනට එසේ සිදු නොවේ. ඊට ප්‍රධාන හේතුව, කොළඹින් පිටස්තර තොග වෙළෙඳුන් තමන්ගේ ලොරිවලින් නිෂ්පාදන ප්‍රදේශවලට ගොස් එළවළු සහ පලතුරු මිල දී ගෙන අලෙවි කිරීම යි. මේ නිසා කෑගල්ල, අකුරැස්ස වැනි ප්‍රාදේශීය තොග වෙළෙඳපොළ බිහි වී ඇත. ඊට අමතර ව සිල්ලර වෙළෙඳුන් කණ්ඩායම් වශයෙන් ඒකරාශී වී වාහන කුළියට ගෙන නිෂ්පාදන ප්‍රදේශවල එකතු කරන මධ්‍යස්ථානවලින් එසේ නැතිනම් දඹුල්ල වැනි වෙළෙඳපොළ තුළින් එළවළු/පලතුරු මිල දී ගැනීම සිදු කෙරේ. එලෙස කොළඹ කේන්ද්‍ර කරගත් එළවළු/පලතුරු තොග වෙළෙඳාම මේ වන විට දිවයිනේ අනෙකුත් ප්‍රදේශ කරා විමධ්‍යගත වී ඇත. මෙම තත්ත්වය එළවළු/පලතුරු තොග

වෙළෙඳාමේ ශුභවාදී වර්ධනයක් ලෙස පෙන්නුම් කළ හැක. එක් අතකින් කොළඹ තදබදය අඩු වී ඇත. අනෙක් අතින් වියදම අඩු වී ඇත. එමෙන් ම, ප්‍රවාහන තදබදය ද අඩුවීම නිසා අපතේ යාම අඩු වී ඇත.

වෙළෙඳපොළ මිල තීරණය කරන ප්‍රධාන බලවේගය ගැණුම්කරුවන් ය. ඔවුහු වෙළෙඳපොළ තුළ ඇවිද සැපයුම් තත්ත්වය පරීක්ෂා කරති. පෙරදිනට සාපේක්ෂ ව සැපයුම් තත්ත්වය වැඩි නම් පෙර දිනට වඩා මිල අඩුකර ඉල්ලුම් කරයි. ගැණුම්කරුවන් ප්‍රමාණය ද මිල කෙරෙහි බලපායි. වර්ෂාව වැනි හේතුවක් නිසා ගැණුම්කරුවන් අඩුවෙන් පැමිණිය හොත් මිල පහළ බසී. එවැනි තත්ත්වයක් පරීක්ෂණ දිනවල දී නිරීක්ෂණය විය. සමීක්ෂණය සිදුකළ ඔක්තෝබර් මස 29 දින වර්ෂාව නිසා පැමිණි වෙළෙඳුන් සංඛ්‍යාව අඩු විය. ඒ අනුව ඊට පෙර දින රු. 60 ක් වූ බෝංචි කිලෝවක් රු. 40 දක්වා අඩුවිය. නැවතත් ඔක්තෝබර් 30 දින වෙළෙඳුන් වැඩිවීම නිසා බෝංචි මිල රු. 60 දක්වා ඉහළ යන ලදී. කොමිස් වෙළෙඳුන් ද උපරිම මිලකට අලෙවි කිරීමට උත්සාහ ගන්නා බව නිරීක්ෂණය විය. එසේ නොමැති නම් තමන්ට ගොවින්/එකතු කරන්නන් එළවළු එවීම අඩුකිරීම හෝ නතර කිරීම සිදු කරන බව කොමිස් වෙළෙන්දෝ පැවසූහ. වර්තමානයේ ගොවින්ට/ එකතු කරන්නන්ට විකල්ප අලෙවි මාර්ග පැවතීම ඊට හේතුව යි. ගොවින්ට තම එළවළු අලෙවි කළ හැකි මාර්ග කිහිපයක් ඇත. තම ගමේ දී එකතු කරන්නන්ට හෝ එසේ නැතිනම් දඹුල්ල/ කොළඹ/ආර්ථික මධ්‍යස්ථානවලට අලෙවි කළ හැක. මේ අනුව ගැණුම්කරුවන්ගේ සහ විකුණුම්කරුවන්ගේ තරඟකාරීත්වයකින් මිල තීරණය වන බවත්, ගැණුම්කරුවන් මිල තීරණය කිරීමේ දී වැඩි බලපෑමක් කරන බවත් නිරීක්ෂණවල දී පෙනී ගියේය.

වගු අංක 10

**එළවළු/පලතුරු රැගෙන යන වාහන පැමිණෙන වේලාව**

| පැමිණෙන ප්‍රදේශ | 2010-10-29 | | 2010-10-30 | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගම්පහ දිස්ත්‍රික්කය (ජා - ඇල, කඳාන, වත්තල, කඩවත, කිරිබත්ගොඩ) | 123 | 21 | 106 | 20 | 229 | 21 |
| කළුතර දිස්ත්‍රික්කය (පානදුර, කළුතර, හොරණ, බණ්ඩාරගම, අලුත්ගම, බේරුවල ) | 25 | 4 | 16 | 3 | 41 | 4 |
| කොළඹ දිස්ත්‍රික්කය (හෝමාගම, මහරගම, කඩුවෙල, මාලබේ, අතුරුගිරිය, මොරටුව ) | 126 | 22 | 127 | 24 | 253 | 22 |
| කොළඹ නගර ප්‍රදේශ | 298 | 51 | 256 | 49 | 554 | 50 |
| අනිකුත් ප්‍රදේශ | 11 | 2 | 18 | 4 | 29 | 3 |
| එකතුව | 583 | 100 | 523 | 100 | 1106 | 100 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත, (2010). හෙ.ගො.ප.පු. ආයතනය.

වාහන නතර කිරීම ද සංවිධානාත්මක ව සිදුවේ. මුලින් පැමිණෙන ලොරි ඇතුළට ගෙන බඩු බෑම අවසන් කළ විගස එම ලොරි පිටත් කර අනෙක් ලොරි ඇතුල්වේ. එළවළු මිල දී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන්ගේ ලොරි/වාහන නතර කිරීම සඳහා වෙන්වූ වෙනම ස්ථාන ඇත. වෙළෙඳපොළේ ඉඩ මදිකම නිසා සමහර ගැණුම්කරුවන්ගේ ලොරි වෙළෙඳපොළින් පිට නතර කර ඇත. ගාලු පාරේ ගමන් කරන මොරටුව, පානදුර, අම්බලන්ගොඩ ලොරි වෙළෙඳපොළෙන්

පිට නතර කර තිබුණි. දුර වැඩිකම නිසා නාටාම් කුලිය වැඩිපුර එනම් කැල්ලකට රු.30ක් වන සේ ගෙවීමට එවැනි ස්ථානවල නතර කර ඇති ලොරිවලින් පැමිණෙන ගැණුම්කරුවන්ට සිදුවේ.

පවතින තත්ත්වය යටතේ වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සාර්ථක ව සිදුවන බව නිරීක්ෂණය විය. මීට ප්‍රධාන හේතුව මැනිං වෙළෙඳපොළට විකල්ප අලෙවි මාර්ග බිහිවීම නිසා තරඟකාරීත්වය වැඩිවීම යි. ප්‍රවාහන පහසුකම් දියුණුවීමත් සමඟ බොහෝ තොග වෙළෙඳුන් ලොරි මිලට ගෙන හෝ කුලියට ගෙන නිෂ්පාදන ප්‍රදේශවලට ගොස් එළවළු මිල දී ගැනීමට පටන් ගෙන ඇත. එමෙන් ම දඹුල්ල, කෑගල්ල, අකුරැස්ස වැනි අමතර තොග වෙළෙඳපොළ බිහි වී ඇත. ඊට අමතර ව මීගොඩ, වැලිසර සහ නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථාන බිහි වී ඇත. අනෙක දැනට සුපිරි වෙළෙඳසැල් වර්ධනය වෙමින් පවතී. ඒවාට එළවළු සපයන ගොවීන් සහ ඒවායින් එළවළු මිල දී ගන්නා පාරිභෝගිකයින් බිහි වී ඇත. මෙම තත්ත්වය තුළ මැනිං වෙළෙඳපොළට අනිකුත් අලෙවි මාර්ගවලින් තරඟයක් එල්ල වී ඇත. මෙම තරඟකාරීත්වය මැනිං වෙළෙඳපොළේ කටයුතු කාර්යක්ෂම වීමට හේතු වී ඇත. අනෙකුත් අලෙවි මාර්ග සමඟ තරඟ කිරීමට නො හැකි වුව හොත් අදාල වෙළෙඳපොළ කඩා වැටෙනු ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොළ සමඟ තරඟකිරීමට නො හැකි ව එම දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ආර්ථික මධ්‍යස්ථාන සාර්ථක ව ක්‍රියාත්මක නො වීම එක් උදාහරණයකි.

## 5. නව වෙළෙඳපොළක් පිහිටුවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු

මැනිං වෙළෙඳපොළ වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීමේ යෝජනාව කාලයක් තිස්සේ සාකච්ඡාවට භාජනය වී ඇත. මෑත කාලයේ නැවතත් එම අදහස ඉස්මතු වී තිබේ. ලංකාවේ පිහිටු වූ බොහෝ වෙළෙඳපොළ අසාර්ථක වී ඇති බැවින්, වෙළෙඳපොළක් පිහිටුවීමේ දී එහි සාර්ථකත්වයට බලපාන සාධක කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු ය (Merle Menegay, *et al* 1996).

### 01. ස්ථානය

ගැණුම්කරුවන්ට සහ සැපයුම්කරුවන්ට පහසු ස්ථානයක් විය යුතු ය. කජුගම කජු වෙළෙඳපොළ ගැණුම්කරුවන්ට පහසු නො වීම නිසා අසාර්ථක වූ වෙළෙඳපොළකට එක් උදාහරණයකි. ඉතාමත් දැකුම්කළු අලංකාර ලෙස කජුගම කජු අලෙවි කිරීම සඳහා වෙළෙඳසැලක් මාර්ගය ඔබ්බෙන් ඉදිකරන ලදී. සාමාන්‍යයෙන් කජු මිලදී ගන්නේ මාර්ගයේ වාහනවල ගමන් ගන්නන් ය. ඔවුහු කජු දකින විට මිල දී ගැනීමට පෙළඹෙති. කලින් සැලසුමක් නැත. එබැවින් මාර්ගයෙන් ඉවතට වෙළෙඳසැල් ගෙන ගිය විට ගැණුම්කරුවන් අහිමි වී වෙළෙඳපොළ වැසී ගියේය. නැවතත් පෙර පරිදි මාර්ගය දෙපස කජු වෙළෙඳසැල් බිහිවිය. සැපයුම්කරුවන්ට අපහසුවීම නිසා අසාර්ථක වූ එක් වෙළෙඳපොළක් නම්, වීරවිල ආර්ථික මධ්‍යස්ථානය යි. මෙහි දී පත්තේගමුව පොළට එළවළු ගෙනයාම ගොවීන්ට වඩා පහසු ය.

දැනට යෝජිත පෑලියගොඩ වෙළෙඳ මධ්‍යස්ථානය සැපයුම්කරුවන්ට මෙන් ම ගැණුම් කරුවන්ටද පහසු වූ ස්ථානයකි (William *et al* 1996). එළවළු/පලතුරු වැඩි ප්‍රමාණයක් පැමිණෙන නුවරඑළිය, බණ්ඩාරවෙල, වැලිමඩ, මාරස්සන, අනුරාධපුර, කුරුණෑගල වැනි ප්‍රදේශවලින් ද පැමිණෙන ලොරිවලට නුවර මාර්ගය හරහා පෑලියගොඩට පැමිණිය හැකි ය. එමෙන් ම පුත්තලම ප්‍රදේශයෙන් පැමිණෙන ලොරි මීගමුව මාර්ගය හරහා පෑලියගොඩට ළඟා විය හැකි ය. තව ද ඇඹිලිපිටිය, රත්නපුර ප්‍රදේශවලින් පැමිණෙන ලොරි ඔරුගොඩවත්ත හරහා පෑලියගොඩට පැමිණිය හැකි ය. එසේ ම, ජා-ඇල, මීගමුව, කිරිබත්ගොඩ, කඩවත, තොටලඟ, මරදාන යන නගරවල සිල්ලර වෙළෙඳුන්ට ද පෑලියගොඩට පැමිණීම පහසු ය. අල, ලූනු, මිරිස් අලෙවි කරන 4 වන හරස් වීදියේ වෙළෙඳුන්ගේ ගබඩා වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ ද පෑලියගොඩ ප්‍රදේශයේ ය.

## 02. වෙළෙඳපොළ සැලැස්ම

ස්ථානය මෙන් ම වෙළෙඳපොළ සැලැස්ම ද වෙළෙඳපොළක සාර්ථකත්වයට බලපාන ප්‍රධාන සාධකයකි. මෙය තීරණය වන්නේ ගැණුම්කරුවන්ගේ මිල දී ගැනීමේ රටාව අනුව යි. එළවළු තොග වෙළෙඳාමේ දී ගැණුම්කරුවන්ට පහසුවෙන් එළවළු තොග නිරීක්ෂණය කිරීමට හැකියාව තිබිය යුතු ය. ඒ අනුව බිත්තිවලින් ආවරණය වූ වෙළෙඳ කුටි නොගැලපේ. බහු වාර්ෂික බෝග ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව දඹුල්ලේ පිහිටුවනු ලැබූ එළවළු තොග වෙළෙඳපොළ බිත්තිවලින් ආවරණය කර කොටස් සමූහයකින් සමන්විත විය. එමෙන් ම ඉතාමත් දැකුම්කළු අන්දමට වෙන වෙන ම කුටි එම වෙළෙඳපොළේ ඉදිකර තිබුණි. නමුත් එම වෙළෙඳපොළ විවෘත කිරීමටවත් නො හැකි විය. දැනට ක්‍රියාත්මක දඹුල්ල තොග වෙළෙඳපොළේ ද ඇත්තේ බිත්තිවලින් ආවරණය වූ කඩ කාමර වේ. එම නිසා වෙළෙඳාම සිදුවන්නේ ඉන් පිටස්තර නවතා ඇති ලොරිය තුළ දී ය.

ලංකාවේ පළාත් පාලන ආයතනවලින් පිහිටුවා ඇති සිල්ලර මාර්කට් බොහොමයක් අසාර්ථක වී ඇත. තොටලඟ සහ මරදාන උදාහරණයන් ය. එහි දී තට්ටුවලින් සමන්විත සුවිසල් ගොඩනැඟිලි ඉදිකරනු ලැබේ. බටහිර රටවල මෙන් ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් වෙළෙඳසැල්වල කාලය ගත කරන්නේ නැත. ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ ඉක්මනින් භාණ්ඩ මිල දී ගෙන තම නිවසට යාම යි. බස් හා දුම්රිය නැවතුම් පොළ අසල වෙළෙඳසැල් බිහිවීමටත්, එවා වර්ධනය වීමටත් හේතු වී ඇත්තේ මෙම තත්ත්වය යි. එමෙන් ම ගම් තුළ කුඩා සිල්ලර වෙළෙඳසැල් බිහිවීමට ද මෙය හේතුවක් වී ඇත.

වෙළෙඳපොළ සැලසුම් සකස් කිරීමේ දී ඉංජිනේරුවන්ට අමතර ව සමාජ විද්‍යාඥයින්ගේ (ආර්ථික විද්‍යාඥයින්, වෙළෙඳපොළ විශේෂඥයින්) සහ වෙළෙඳුන්ගේ සහභාගීත්වය ලබාගත යුතු ය. මේ සම්බන්ධයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ ආයතනයට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කළ හැකි ය.

## 03. වෙළෙඳපොළ පහසුකම්

මාර්ග පහසුකම් මේ අතර ප්‍රධාන වේ. වෙළෙඳපොළට පිවිසෙන මාර්ග සහ වෙළෙඳපොළෙන් පිටවන මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ඒවා අදාළ පාර්ශ්වයන්ට බාධාවක් නො විය යුතු ය. එමෙන් ම වාහන නවතා තැබීමේ පහසුකම් ද නොඅඩුව තිබිය යුතු ය. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ජනප්‍රිය වීම සඳහා මාර්ග පහසුකම් සහ වාහන නවතා දැමීමේ පහසුකම් සෘජු ලෙස බලපා ඇත. එමෙන් ම කාර්යාල පරිශ්‍රයක්, ආපනශාලා, බැංකු, රැස්වීම් ශාලාවක්, වෛද්‍ය පහසුකම්, ආරක්ෂක පහසුකම්, ශීත කාමර වැනි පහසුකම් ද තිබිය යුතු ය. සනීපාරක්ෂක කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු ය. වැසිකිළි, ජලය බැසයාමේ කානු පද්ධති, පානීය ජලය මේ අතර ප්‍රධාන වේ. ජනයා විශාල වශයෙන් රැස්වෙන වෙළෙඳපොළ තුළ බාබර් සාප්පු වැනි සේවා පහසුකම් ද අවශ්‍ය විය හැකි යි.

## 04. වෙළෙඳපොළ නඩත්තුව

ශ්‍රී ලංකාව දැවැන්ත වෙළෙඳපොළ ගොඩනැගීමට ප්‍රමුඛතාවයක් දුන්නත් ඒවා නඩත්තු කිරීම කෙරෙහි ඉතාමත් අඩු අවධානයක් යොමු කරයි. මේ නිසා බොහෝ වෙළෙඳපොළ කෙටි කාලයක් තුළ ජනතාවගේ අප්‍රසන්න ස්ථාන බවට පත්වේ. වැසිකිළි කරාම කැඩී ගොස් ය. කාණු පද්ධති හිර වී ඇත. පිරිසිදු කිරීම් සිදු නොවේ. ගොඩනැඟිලි අලුත්වැඩියා නො කෙරේ. මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට වෙළෙඳපොළ කළමනාකරණය කිරීම සඳහා පාලන අධිකාරියක් පිහිටුවිය යුතු ය. එමෙන් ම වෙළෙඳපොළෙන් ලැබෙන ආදායමෙන් අඩුම වශයෙන් 25% ක්වත් වෙළෙඳපොළ නඩත්තුව සඳහා වෙන්කළ යුතු ය.

## 05. අන්තර් වෙළෙඳපොළ සම්බන්ධතා

අදාළ වෙළෙඳපොළ අනෙකුත් වෙළෙඳපොළ සමඟ තිබෙන සම්බන්ධතා මේ යටතට වැටේ. කොළඹ මැනිං වෙළෙඳපොළ සහ හතරවන/පස්වන හරස් වීදියේ අල, ළූනු, සහල්, පිටි ආදිය අලෙවි කරන වෙළෙඳසැල් අතර ඇති සම්බන්ධතා මෙහි දී පෙන්වා දිය හැකි ය. මැනිං වෙළෙඳපොළට එළවළු රැගෙන එන ලොරි හතරවන/පස්වන හරස් වීදියට ගොස් අල, ළූනු, මිරිස් ආදිය පටවා ගෙන ආපසු යයි. එමෙන් ම එළවළු මිලදී ගන්නට එන වෙළෙන්දෝ එක්කෝ හතරවන හරස් වීදියෙන් අල, ළූනු, මිරිස් සහල් ආදිය මිලට ගෙන එළවළු මිලදී ගැනීමට මැනිං වෙළෙඳපොළට පැමිණෙති. නැතිනම් මැනිං වෙළෙඳපොළෙන් එළවළු මිලදී ගෙන අල, ළූනු, මිරිස් ආදිය මිලදී ගැනීමට හතරවන හරස් වීදියට යති. මේ නිසා මැනිං වෙළෙඳපොළ වෙනත් ස්ථානයකට ගෙනයාමේ දී අනිවාර්යයෙන් ම හතරවන හරස් වීදියේ අල, ළූනු වෙළෙඳසැල් ද ඉවත් කළ යුතු ය. සමහරවිට ඒවා පෞද්ගලික වෙළෙඳසැල් නිසා ඉවත් කළ නො හැකි විය හැකි ය. එසේ නම් එළවළු/පලතුරු වෙළෙඳසැල්වලට අමතර ව සහල්, අල, ළූනු, මිරිස් ආදිය සඳහා වෙළෙඳසැල් ඇති කළ යුතු ය. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සාර්ථක වීමට එළවළුවලට අමතර ව සහල්, අල, ළූනු, මිරිස් තොග කඩ ඇති කිරීම ද හේතු වී ඇත.

## 6. නිගමන සහ යෝජනා

දැනට පවතින තත්ත්වයන් යටතේ මැනිං වෙළෙඳපොළ කාර්යක්ෂම ව ක්‍රියාත්මක වේ. නමුත් ප්‍රමාණවත් පහසුකම් නොමැතිකමින් වාහන නැවත්වීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැත. ගොඩනැඟිලි අලුත්වැඩියා කර නොමැත. කොළඹ නගරයේ කේන්ද්‍රීය ස්ථානයේ පිහිටා ඇති බැවින් වාහන තදබදය වැඩි වී තිබේ. මේ සියළු කාරණා එළවළු අපතේ යාමට හේතු වී ඇත. මේ නිසා මැනිං වෙළෙඳපොළ වෙනත් ස්ථානයකට රැගෙන යා යුතු ය.

නව වෙළඳපොළ පිහිටුවීමේ දී පහත සඳහන් යෝජනා කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

01. මැනිං වෙළෙඳපොළ සමඟ හතරවන වීදියේ ස්ථාපනය වී ඇති සහල්, අල, ළූනු, මිරිස් වෙළඳසැල් ඉවත් කර නව වෙළෙඳපොළ තුළ එකී වෙළෙඳසැල් ද ස්ථාපනය කළ යුතු ය.

02. නව වෙළෙඳපොළ තුළ සියළු ම පහසුකම් එනම්, වාහන නවතා තැබීම, බැංකු, රස්වීම්ශාලා, ශීතාගාර ඇති කළ යුතු ය. සනීපාරක්ෂක කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේදයන් තිබිය යුතු ය.

03. ඉදිකරන ලද නව වෙළෙඳපොළ සරල එකක් විය යුතු ය. නිෂ්පාදන පැහැදිලි ව ප්‍රදර්ශනය වන පරිදි විවෘත ගොඩනැඟිලි තිබිය යුතු ය. මේ සම්බන්ධයෙන් මැනිං වෙළෙඳ සංගමයේ අදහස් ලබා ගැනීම කළ යුතු ය. කඩ බක්කියක ප්‍රමාණය අඩි 20x10 විය යුතු බව වෙළෙඳ සංගමයේ අදහස විය. දැනට යෝජිත ප්ලාස්ටික් ඇසුරුම් භාවිතා කරන්නේ නම් කඩ බක්කියක ප්‍රමාණය මීට වඩා විශාල විය යුතු ය. ප්ලාස්ටික් කුඩා භාවිතා වන්නේ වෙන්දේසි තොග වෙළෙඳපොළ බැවින් මෙවැනි තොග වෙළෙඳපොළ සඳහා එය කෙතෙක් දුරට යෝග්‍ය වන්නේ දැයි අවධානය යොමු කළ යුතු ය. වෙළෙඳ සංගමය විසින් ද ප්ලාස්ටික් කුඩා ක්‍රමය ප්‍රායෝගික නො වන බවට අදහස් ඉදිරිපත් කරන ලදී.

04. වත්මන් වෙළෙඳපොළේ සියළුම බලපත්‍රලාභීන්ට (1200 පමණ) වෙළෙඳසැල් ලබාදීමට

ගිය හොත් වෙළෙඳපොළ අනවශ්‍ය ලෙස විශාල වීමට ඉඩ තිබේ. දඹුල්ල වෙළෙඳපොළ තුළ පවා ඇත්තේ වෙළෙඳසැල් 143 ක් පමණි. එබැවින් මුදල් ගෙවා බලපත්‍රලාභීන් ස්වකැමැත්තෙන් ඉවත්වීමේ ක්‍රමවේදයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. වර්තමානයේ මැනිං වෙළෙඳපොළ තුළ සිල්ලර වෙළෙඳාම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. බස්නැවතුම්පොළ සහ දුම්රිය ස්ථානය ඊට බලපා ඇත. මෙම තත්ත්වය තුළ ස්ථානයක සිල්ලර වෙළෙඳාම වර්ධනය වීමට ඇති ඉඩකඩ සීමාසහිත ය. එබැවින් සිල්ලර වෙළෙඳුන් අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එමෙන් ම වත්මන් මැනිං වෙළෙඳපොළ ආසන්නයේ සිල්ලර වෙළෙඳපොළක් පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් ය. විකල්ප තොග අලෙවි මාර්ග වර්ධනය වන බැවින් තොග වෙළෙඳාම ද වර්ධනය වීමට ඉඩක් නැත. කුඩා වෙළෙඳ කුටිවලින් සමන්විත අතිවිශාල වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට වඩා ප්‍රමාණවත් වෙළෙඳපොළක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ලෝකයේ අනෙකුත් රටවල ක්‍රියාත්මක වන තොග වෙළෙඳපොළවල විශාලත්වය සොයා බැලීම වැදගත් ය.

05. වෙළෙඳපොළ පාලනය කිරීම සඳහා කළමනාකරණ අධිකාරියක් පිහිටුවිය යුතු ය. එය වෙළෙඳුන්ගෙන්, නිලධාරීන්ගෙන් සහ ගොවීන්ගෙන් සමන්විත විය යුතු ය. වෙළෙඳපොළ නඩත්තුව සඳහා ලැබෙන ආදායමින් අඩුම වශයෙන් 25% ක් ඊ සඳහා වෙන් කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. Merle, Menegay, *et al,* (1996). Study of Agriculture Markets in Sri Lanka. World Bank /HARTI.

2. Nanayakkara, U. (1991). Vegetable and Fruit Handding at the Colombo Manning Market. ADA.

3. William, G, *et al,* (1995). Guidelines for the Diagnosis of Urban Wholesale Market Places for Fresh Fruit and Vegetables in South and Southeast Asia. USAID.

ඇමුණුම අංක 1

## මැනිං වෙළෙඳපොළේ පිහිටීම, කඩ ව්‍යාප්තිය පිළිබඳ දළ සැලැස්ම

